<u>ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය</u>

## <u>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ යාන්ත්‍රික ශිල්පී තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම (විවෘත)</u>

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ යාන්ත්‍රික ශිල්පී තනතුරේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.09.21 දින හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, පේරාදෙණිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " <u>යාන්ත්‍රික ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය(විවෘත)</u> යන්න සඳහන් කළ යුතුය.

**01.**තනතුර -: යාන්ත්‍රික ශිල්පී III ශ්‍රේණිය.
මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

**02.**මාසික වැටුප් පරිමාණය -: රු.25,250-10x270-10x300-10 x330- 12 x350 - 38,450/-( PL-2 -2016)
(වැටුප් ගෙවනු ලබන්නේ ,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 උපලේඛණ II හි සඳහන් පරිදිය.)

**03.**වයස් සීමාව -: 2018.09.21 දිනට වයස අවු .18 ට නොඅඩු විය යුතු අතර ,අවු. 45 ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

**04.**අධ්‍යාපන සුදුසුකම් -: අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**05.**වෘත්තීය සුදුසුකම් -: තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික ශිල්පීය කටයුතු පිළිබඳව ප්‍රවීනතා සහතිකයක් ලබාතිබීම.

**06.**පළපුරුද්ද -: යාන්ත්‍රික ශිල්පය පිළිබඳ වසර 02ක සේවා පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.

**07.**කායික සුදුසුකම් -: ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරිමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**08.**වෙනත් සුදුසුකම් -: i.අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2018.09.21 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**09.**බඳවා ගැනීමේ ක්‍රමය -: වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රථිපල මත පවත්නා පුරප්පාඩු වලින් 50%ක් පුරවනු ලැබේ.පළමුව වෘත්තීය පරීක්ෂණය පවත්වනු ලැබේ.වෘත්තීය පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අතරින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.වෘත්තීය පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල එකතුව අනුව කුසලතා අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

★★★වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන්නේ පහත සඳහන් පරිදි වේ.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I | ක්ෂේත්‍රයට අදාල මූලික දැනුම | 20 | |
| II | උපකරණ සවි කිරීම, අලුත් වැඩියා කිරීම, පිළිබඳ දැනුම | 20 | |
| III | අදාල ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | 40% |
| IV | ක්ෂේත්‍රයට අදාල උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |

★★★ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | |
| II | අතිරේක වෘත්තීය පුහුණුව | 60 | |
| III | අතිරේක පළපුරුද්ද | 10 | අදාල නැත. |
| IV | අමතර සුදුසුකම් | 10 | |
| V | සම්මුඛ පරීක්ෂණයේදී පිළිබිඹු කරන කුසලතා | 05 | |

**10.සේවා කොන්දේසි**

(i) පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය ප්‍රතිපත්ති වලටද ,රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග , කාර්ය පටිපාටික රීති ,ආයතන සංග්‍රහයේ විධිවිධාන , මුදල් රෙගුලාසි හා රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසි වලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වනු ඇත.

(ii) බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් එක් වසරකට වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ .විවෘත බඳවා ගැනීම් තුලින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව ,නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීමද අවශ්‍ය වේ.

(iii) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් දෙවන භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැදී වසර 05 ක් තුල ලබා ගත යුතුය.

(iv) දෙපාර්තමේන්තුව මඟින් නියම කරනු ලබන සේවා ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතුය.

(v) දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(vi) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද ,මූලික සුදුසුකම් සපුරා නැති අයදුම්පත්ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) මෙහි සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් , ඒ සම්බන්ධව තීරණ ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

වෛද්‍ය නිහාල් වෙදසිංහ
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
දිනය -: 2018.08.16
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය.